# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 19 දරන
# වතු (පැවරීම හා අත්කර ගැනීම පාලනය කිරීම) (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1982 අංක 19 දරන වතු (පැවරීම හා අත්කර ගැනීම පාලනය කිරීම) (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1982 මැයි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 85/78

**1972 අංක 2 දරන වතු (පැවරීම හා අත්කර ගැනීම පාලනය කිරීමේ) පනත ඉවත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1982 අංක 19 දරන වතු (පැවරීම හා අත්කර ගැනීම පාලනය කිරීම) (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1972 පෙබරවාරි මස 18 වන දින හෝ ඊට පසු යම් වත්තක අයිතිය පැවරීම කර ඇත්තේ ද ඒ පැවරීම, 1972 අංක 2 දරන වතු (පැවරීම හා අත්කර ගැනීම පාලනය කිරීමේ) පනතේ 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අනුමතය දීමේ සහතිකයක් නොමැතිව කරන ලද්දේ වුව ද, සියලු කාර්ය සඳහා නීතියෙහි ලා වලංගු ලෙස සලකනු ලැබිය යුතු ය : ඇතැම් අයිතිය පැවරීම නීතියෙහි ලා වලංගු බව.

එසේ වුව ද, ඒ වත්තේ අයිතිය පිළිබඳ නීත්‍යනුකූල පැවරීමක් පසුව ලබා ගෙන තිබූ යම් පාර්ශ්වකරුවකුගේ හෝ ඔහුගේ පූර්වග අයිතිකරුවකුගේ හිමිකමට වඩා උසස් හිමිකමක් එකී පැවරීම වලංගු බවට පත් කිරීමේ හේතුවෙන් නොපැවරේ.

3. 1972 අංක 2 දරන වතු (පැවරීම හා අත්කර ගැනීම පාලනය කිරීමේ) පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1972 අංක 2 දරන පනත ඉවත් කිරීම.

4. මේ පනතෙහි— අර්ථ නිරූපණය

"වත්ත" යන්නෙන්—

(i) වෙනම සහ වෙන් වෙන්ව පිහිටා ඇති දේපළකින් සංයුක්ත වන ;

(ii) තැනැත්තන් එක් කෙනකු හෝ ඊට වැඩි දෙනකුට අයත් වන හෝ එක් කෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින් දරනු ලබන ; සහ

(iii) 1962 ජනවාරි මස 1 වන දිනට පසු යම් අවස්ථාවක මුළු අක්කර ප්‍රමාණයෙන් අක්කර එක් සියයකට නොඅඩු ප්‍රමාණයක් වගාව හෝ කෘෂිකර්මයට අදාළ යම් කාර්යයක් සඳහා යොදා ගනු ලබන්නා වූ නැතහොත් යොදා ගනු ලැබූවා වූ ද

යම් ඉඩමක් හෝ ඉඩම් සමූහයක් අදහස් වන අතර, විකුණනු නොලැබූ පලදාව, ඒ වතුවලට අයත් වන්නා වූ සහ ඒ වත්ත පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයාගේ

මතය අනුව අවශ්‍ය වන්නා වූ සියලු ගොඩනැගිලි, සවිකිරීම්, යන්ත්‍රෝපකරණ, උපකරණ, වාහන සහ චංචල හෝ නිශ්චල වෙනත් දේවල් ද ඊට ඇතුළත් වේ ; තව ද

" අයිතිය පැවරීම " යන්න, යම් වත්තක් සම්බන්ධයෙන් යෙදෙන විට, බෙදූ හෝ නොබෙදූ ඒ වත්තේ හෝ එහි යම් කොටසක අයිතිය විකිණීමකින්, හුවමාරු කිරීමකින් හෝ තෙස්තමේන්තු මුදල් බැහැර කිරීමකින් දෙනු ලැබූ තෑග්ගක් නොවන තෑග්ගකින් පැවරීම හෝ බෙදූ හෝ නොබෙදූ ඒ වත්ත හෝ එහි කොටස අවුරුදු දහයක් ඉක්මවන කාලයක් සඳහා බදු දීම හෝ බෙදූ හෝ නොබෙදූ ඒ වත්තේ හෝ එහි කොටසේ යම් උකස් කිරීමක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.